# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
த.பெ.1559, பொது திறைசேரி, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு , கொழும்பு 01 ,இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Planning and Economic Development, Colombo 01, Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: +94 11 2484600, +94 11 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: +94 11 2484970, +94 11 2320042
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No.: TO/GR /Miscellaneous (iii)
ඔබේ අංකය / உமது இல / Your:
දිනය / திகதி / Date: 11.12.2025

අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

<u>දේශීය හා විදේශ ප්‍රදාන සඳහා අක්මුදල් ඉල්ලීම්</u>

2025 වර්ෂයට අදාලව ගිණුම් පියවීමේ කටයුතු 2025.12.31 දිනෙන් අවසන් වන බැවින්, මූල්‍ය සංකේත අංක 13 (විදේශ ප්‍රදාන) හා මූල්‍ය සංකේත අංක 11 (දේශීය ප්‍රදාන) යටතේ ප්‍රතිපාදන සලසා ඇති, දේශීය හා විදේශ ප්‍රදාන වැය විෂයන්ට අදාල සියළුම අක්මුදල් ඉල්ලීම් 2025.12.24 දින හෝ ඊට ප්‍රථමව මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

එසේම, විදේශ ආධාර ගිණුම් තැබීම සම්බන්ධයෙන් වූ 1994 අප්‍රේල් 20 දිනැතිව නිකුත් කරන ලද අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් විදේශ ආධාර සම්බන්ධයෙන් වන සියළුම වියදම් වාර්තා ඉහත චක්‍රලේඛයේ ආකෘති අනුව ද දේශීය ත්‍යාග/ප්‍රදාන උපයෝජනය හා ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් 2022.07.08 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2022 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශය ප්‍රකාරව අදාල වියදම්, විස්තර/ඇමුණුම් මගින් 2026.01.09 දින හෝ ඊට ප්‍රථමව ලැබෙන සේ මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

තවද, 2025 වර්ෂයේ ගිණුම් පියවීමට අදාලව නිකුත් කර ඇති අංක 06/2020 හා 2025.11.19 දිනැති මෙම දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයට අනුගත වෙමින්, 2025 වර්ෂයේ අක්මුදල් ඉතිරිවීම් ආපසු ප්‍රේෂණය කිරීමේදී දේශීය හා විදේශ ප්‍රදාන අක්මුදල් ඉතිරිවීම් පිළිබඳ තොරතුරු, මෙම දෙපාර්තමේන්තුවේ දේශීය හා විදේශ ප්‍රදාන අංශයට පිටපතක් ද සහිතව යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ජූඩ් නිලුක්ෂාන්

අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)